පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව - සති පාසල

8 වන සතිය

විෂය - විද්‍යාව

9 ශ්‍රේණිය

කාලය - පැය 2

සැකසුම - එම්.ජී.ඒ.වී.කේ. ධර්මරත්න.
කලාප අධ්‍යාපන කාර්යාලය - නිවිතිගල.

Department of Education, Sabaragamuwa Province/ Weekly School

**<u>මාතෘකාව - ජීවීන්ගේ සන්ධාරණය හා චලන</u>**

<u>පාඩම - ශාක චලනය හා සන්ධාරණය</u>

* මෙම අධ්‍යයනය අවසානයේදී ඔබ,

- ශාක වල ආවර්ති චලන හා සන්නමන චලන ආදර්ශණය කරයි.
- ශාක වලට සතුන් මෙන් පවතින ස්ථානය වෙනස් කළ නොහැකි බැවින් ශාක ස්ථානීය සංරක්ෂණයේ වැදගත්කම අගය කරයි.

* පලමුව 9 ශ්‍රේණිය පෙළ පොතෙහි ( 1 කොටස ) පිටු අංක 92,93,94 හා 95 පිටු කිහිප වතාවක් කියවන්න.

92 පිටුව කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. හිස්තැන් පුරවන්න.
   - කුඩළු වැනි ________ (අරටුවක් නොමැති) ශාක ඍජුව හා ප්‍රාණවත්ව තබා ගැනීම සඳහා (සන්ධාරණ කෘත්‍ය) ශාක සෛල _________ පිරී පැවතීම අත්‍යවශ්‍ය වේ.
   - අරටුව (කෘෂ්ටිය කඳන්) සහිත ශාක, සෛල වල ජල ප්‍රතිශතය අඩු වූවාට කදෙහි ඍජු බව නැතිවී නොයයි. ඊට හේතුව _________ _________ බහුලවම ඇති අරටුව සෑදී සෛල තුල _________ _________ වැනි විවිධ රසායනික සංයෝග තැන්පත් වීම නිසා ශාක _________ දැඩි බවක් ලබා දීමයි.
2. ශාක චලන ලෙස හඳුන්වන්නෙ කුමක්ද ?
3. ශාක චලන ප්‍රධාන ආකාර දෙක ලියන්න.

දැන් පිටු අංක 92හි අවසාන ඡේදය හා පිටු අංක 93 යලි හොඳින් කියවන්න.

මෙම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. “ආවර්ති චලන” යන්න නිර්වචනය කරන්න.
2. ප්‍රතිචාරය උත්තේජනය දෙසට සිදුවන ආවර්ති චලන කුමන නමකින් හඳුන්වයිද ?
3. ප්‍රතිචාරය උත්තේජනයෙන් ඉවතට සිදුවන චලන කුමන නමකින් හඳුන්වයිද ?
4. ධන ගුරුත්වාවර්ති චලන හා ඍණ ගුරුත්වාවර්ති චලන ලියා, ඒ එක එකෙහි ඉදිරියෙන් උදාහරණය බැගින් ලියන්න. (93 පිටුවේ ඉහල ඡේදය)
5. ආවර්ති චලන සඳහා වර්ධක ද්‍රව්‍ය වල බලපෑමක් ඇත්ද?

දැන් 94 පිටුව නැවත හොඳින් කියවන්න. පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. "සන්නමන චලන" යන්න නිර්වචනය කරන්න.
2. සන්නමන චලන සඳහා වර්ධක ද්‍රව්‍ය වල බලපෑමක් ඇත්ද ?
3. ශාක විසින් දක්වන සන්නමන චලන ලියා ඒ එකින් එකට උදාහරණය බැගින් ඉදිරියෙන් ලියන්න.
4. අඳුර වැටීමත් සමග කතුරුමුරුංගා, සියඹලා,නෙල්ලි වැනි ශාක වල පත්‍ර හැකිලේ. එය සිදු වන ආකාරය ලියන්න. (94 පිටුව අවසන් ඡේදය බලන්න)

ඉන්පසු පිටු අංක 95 හොඳින් කියවන්න.පසුව,

* ස්ථානීය සංරක්ෂණය යන මාතෘකාව යටතේ කරුණු ඉදිරිපත් කරන්න.

දැන් ඔබ මෙම පාඩම අවසන් කර ඇති බැවින් පිටු අංක 96,97 හි ඇති අභ්‍යාස වල නිරත වන්න.

** අමතර දැනුම සඳහා, හැකිනම්,

- පුවත් පත් හා සගරා වලින් අමතර කරුණු සොයා කියවන්න.
- 10 ශ්‍රේණිය පෙල පොතෙහි 1 කොටසෙහි 145,146 පිටු කියවන්න.
- එසේම පහත සබැදිය ඔස්සේ ඇති මෙම වීඩියෝව නරඹන්න.

- https://www.youtube.com/watch?v=-0MqtDBML4c